# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1338 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 23/10/2023<br>පැය 1905 |

## මාධ්‍ය නිවේදනය

**මනුෂ්‍ය ඝාතනයක් සඳහා සැලසුම් කරමින් සිටි සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2023.10.22 වන දින දහවල් කාලයේ මීනුවන්ගොඩ පොලිස් වසමේ හොරම්පැල්ල ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම සඳහා වැටලීමක් සිදුකර ඇත.

අදාල සැකකරු පදිංචි නිවසේ රැඳී නොසිටි බැවින් නිලධාරීන් මාර්ගයේ සැඟවී සිටියදී සැකසහිත කාර් රථයක් සමඟ පැමිණි යතුරුපැදි දෙකක් නවතා පරීක්ෂා කිරීමක් සිදුකර ඇත. කාර් රථය පරීක්ෂා කිරීමේදී රියදුරු සන්තකයේ තිබී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 500 ක්ද කාර් රථයේ තිබී විදේශ රටක නිෂ්පාදිත ජීව අත්බෝම්බ දෙකක් සහ තියුණු ආයුධ (කඩු) දෙකක්** සොයා ගෙන ඇත.

විමර්ශන නිලධාරීන් විසින් කාර් රථයේ රියදුරු සහ යතුරුපැදි දෙකේ පැමිණි පුද්ගලයින් සිව්දෙනා සැකපිට අත්අඩංගුවට ගෙන ඇති අතර සිදුකරන ලද මූලික විමර්ශනයේදී ඔවුන් ඩුබායි රාජ්‍යයේ රැඳී සිටින සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ මෙහෙයවීම මත මෙම ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකු ඝාතනය කිරීමට සැලසුම් කර ඇති බවත්, ඒ සඳහා තවත් පුද්ගලයෙකු සම්බන්ධ කරගැනීම සඳහා මෙලෙස පැමිණ ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22, 23, 25, 39 හා 56 වයස් වල පසුවන කටුවැල්ලේගම, මීනුවන්ගොඩ, කිඹුලාපිටිය හා හොරම්පැල්ල යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන කොළඹ අපරාධ කොට්ඨාසය විසින් සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**